

# පද සොදය



# පදභෙදය

———✻———

පණ්ඩිත ශිඛාමාණික්‍යවූ කහාවේ

**සද්ධම්ම ජොතිපාල ඤාණානන්ද තිස්ස**

මහාස්ථවිර පාදයන් විසින්.

සඞ්ග්‍රහකරණලදී

—00—

**වැලිතොට**

විජ්ජාභාස පරිවෙණාධිපති

**උක්කාකළඹමහාතිස්සඅරියවංසධජඤාණතිලක**

නායකස්වාමිපාදයන්ගේශිෂ්‍යවූ

**බණ්ඩරමුල්ලේ**

අමරසීහතිස්ස ස්වාමින්විසින්

සන්න ලියන ලදී

නෛකශ්‍රීන් විරජමානවූ ගෞරවනීය
ඇඩ්වත් ගුණරත්නාභිධාන විනිශ්චයකාර ධුරන්ධර
රජවාසල මුදලිමන්ත්‍රීශ්වරයන් විසින් පිළිනත්නාලදී
ඇම්. ඒ. ඕ. සිල්වා වන මා විසින්

වැලිතොට

විද්‍යාරත්නාකර මුද්‍රා යන්ත්‍රාලයෙන්

අච්චුගස්වනලදී

ශ්‍රී. බු. ව. 2433

# ප ද ශෙ ඛ ය.

—·——0✳0✳0———

භණිත ශිඛාමාණිකාවූ

කාහාවේ

**සඩම්ම ජෝතිපාල ඤාණානන්ද හිසස**

මහාසථවිර පාදයන් විසින්

සඞ්ග්‍රහ කරණ ලදි.

———000———

**වැ ලි තො ට**

විජ්ජාභාස පරිවෙණාධි පතී

**උකුකවඨමහාතිසසඅ දිශවංසධජඤාණතිලක**

නායක සවාමිපාදයන්ගේ

ශිෂ්‍යවූ

බිණ්ඩාරමුල්ලේ

අමරසිංහ තිස්ස සවාමින්

විසින්

සන්න ලියන ලදි.

———0⌣0⌣0———

ඇම්. ඒ. ඞී. සිල්වා වන මා විසින්

# වැලිතොට

විද්‍යාරත්නාකර මුද්‍රා යන්ත්‍රාලයෙහි

අච්චුගස්වන ලදි.

———0✳0———

ශ්‍රී. බු. ව. 2433.

# විඥාපනය

———()✳()———

**පදභේදය**—මේ මානැඟි මාගධී ව්‍යාකරණ ග්‍රන්ථය ආචාර්‍ය්‍ය කතාවේ සද්ධම්ම ජෝතිපාල ඤාණානන්ද තිස්ස මහාස්ථවිර පාදයන් විසින් සංග්‍රහ කරණ ලද්දකි—

මේ ස්වාමිහු ත්‍රිපිටක බුද්ධවචනයෙහිද සශ්‍රැති සෛංහලි මාගධී සංස්කෘතාදි නා නා භාෂාවන්හිද ඡන්දෝලංකාරාදි අනෙක ශාස්ත්‍රයන්හිද අතිශය පටුත්වයක් ඇති වූ කෙනෙකි—

අමරපුර වංශය පළමුකොටම ලක්දිව පිහිටවූ "ඤාණවිමල තිස්ස,, මහාසංඝ නායකස්ථවිර පාදයන්ගේ ශිෂ්‍ය වූ බේරතුඩුවේ "ධම්මාධාර තිස්ස,, නායකස්ථවිර පාදයන්ගේ ප්‍රධාන ශිෂ්‍යයෝ මේ ස්වාමිහුමය—

මේස්වාමින්ට ධර්මවිනයාදිය උද්ග්‍රහණය කිරීමෙහි ආචාර්‍ය්‍යවූ යේබෝවල "ධම්මානන්ද,, නායකස්ථවිරපාදයන්වහන්සේය-

මේ නායකස්ථවිර පාදයන්ගේත් ධර්මවිනයාදිය මනාසේ උගත් ශිෂ්‍යයා මුන්වහන්සේමය—මේ ස්වාමින්ට එක්දිනක් තුළ ශ්ලෝක සිය ගණනකට වැඩි ගණනක් ධාරණය වන ඥාන ශක්තියක් ඇතිව තිබුනේය—

මේ නායකස්ථවිර පාදයන් ලඟ ඉගෙණ ගන්නා කාලයෙහි "ශතශ්ලෝක,, ග්‍රන්ථය එක දවසක් අතරේම මේ ස්වාමිහු පාඩම් කොට නිම කළෝයි—

මේ ස්වාමින්ගේ දක්ෂත්වය දුටු එක්තරා මන්ත්‍රියෙක් තමන්ගේ කිසි අදහසක් අරබයා නුගත් වනලෙස නායකස්ථවිරපාදයන්ට බලවත් ලෙස කියාසිටියේය—

එකල්හි නායක ස්ථවිරයෝ ඒ මන්ත්‍රියාට මෙසේ කීවෝය—මට සිංහ නෙල් ටිකක් ලැබී වත්කොට තැබීමට රත්‍රන් භාජනයක් මෙතෙක් කල්ම සොයමින් විසූ නුමුත් නොලැබුනේය—සිංහනෙල් රන් බඳුනෙක්හි මුත් අන් බඳුනක වත්කිරීම අනුචිතයි—දැන් වනාහි රන් බඳුනක් ලැබිතිබෙයි—

ශ්‍රීරත්ඛදනෙහිම මහේසිංහගෙන් විකමත්කාර නබම්සිණි
හාසිංහගෙනලොපමාවදක්වමින්ඉමිස්වාමින්ගේ සත්පුරුෂ
භාවයප්‍රකාශකොටඑනැත්පටන්නමත්ගෙන්යුවලශ්‍රේරසී,
මිත්ධර්මවිනයදනොයෙක්ශාස්ත්‍රයන්දළද්ග්‍රහණයකරවූහ-

ඉන් පසු එක් දිනක් සමය නායක ස්ථවිරයන්ට වඳිනු පිණිස මේස්වාමීන්ද්‍රයන් පැමිණිකල අද අමුතුවෙන්ශ්ලෝකයක් බැඳ බුදුන් වඳු වයි නියොග කළ කල්හි එකෙණෙහිම ශ්ලෝකයක් බැඳ කියා බුදුන්ට නමස්කාර කළෝය—ඒශ්ලෝකය මෙසේයි—

මුකුන්ද නන්දීශ පුරන්දරාදි සුරෙන්ද්‍ර බෘන්දෙ රති වන්දනීයං
සදා මුනීන්ද්‍රස්‍ය පදාරවින්දං මමන්දභක්ත්‍යා ප්‍රණතිං කරෙමි.

තමන් ශිෂ්‍යයන්ගේ ව්‍යක්තභාවය දුටු නායක ස්ථවිරයෝ අධිකප්‍රීතියට පැමිණ බොහෝසේ ආදර බුහුමන් සිර්ගෙන් ශබ්ද ශාස්ත්‍ර ඉගැන්වීම් ආදියෙන් සංග්‍රහ කළෝයි—මෙසේ මේ ස්වාමීන්ද්‍රයෝ ආචාර්‍ය්‍යවර යන්ගේසිත්ගෙණමනාලෙස ඉගෙන අසහාය ව්‍යක්තයෙක්ව අහසෙහි පූර්ණචන්ද්‍රයාමෙන් දෙශදෙශාන්තරයන්හිප්‍රකටවවිසූහ—මේ ස්වාමීන්ද්‍රයන්ටවැඩිපක්ෂපාතකමක් නොමැති උගත් ප්‍රසිඩ වැලිතොට "සාලමොන්ද සොයිසා,, නොටමුණේකමකානම් මහත්මයාවිසින් මේස්වාමීන්ද්‍රයන්ගේ සමත්කමගැණඇසුප්‍රඥණයකටපිළිතුරු වශයෙන් ඒ වේලෙහිම කවියක්ලියා දෙනලදී—ඒකව මෙසේයි—

අ හා උන් සනට සගමොක් සැප දෙව න
චු හා ලැබගත්ඩනිසි මුනිදම් දෙස න
ක හා වේ සම්දුමිස සමතෙක් දෙව න
මොහා නැත මිතුරෙ අපදන්නා වෙනී න

"සාසනවංසදීප-සීමාලක්ඛණ දීපනී,, ආදි ග්‍රන්ථකළාමූ ආචාර්‍ය්‍ය විමලසාර තිස්ස නායකස්ථවිර පාදයන්වහන්සේද කීරුතති රත්නා කර—මුඛ මතන දීපනී අභිධර්මාඛ්‍යාන-එකක්ඛරකොෂ අභිධර්මාඛ්‍යාණාදි ග්‍රන්ථ රාශියක් කළාමූ

අප ආචාර්යෝත්තමයන් වහන්සේ ශ්‍රේෂ්ඨාචාර්ය ධුරන්ධර දෙළුමාරාම තිස්ස මහාස්ථවිරපාදයන් වහන්සේද මේ ස්වාමීන්ද්‍රයන්ගේ ප්‍රධාන ශිෂ්‍යයෝවූහ—මේ ශිෂ්‍යානු ශිෂ්‍යයන්ගේ ප්‍රමාණයෙනුත් මේ ස්වාමීන්ද්‍රයන්ගේ උගත්කමේ ප්‍රමාණය මඳක් දුරට වැටහේමය-මේ ස්වාමීන්ද්‍රයන්ගේ ජීවිත කථාව මුද්‍රණය කරවන්නට පටන්ගෙණ තිබෙන හෙයින් එහෙළින් ක්‍රමට වර්ණනා කරමුද?-මේ ග්‍රන්ථය බාලයන්ට පහසුවෙන් ව්‍යාකරණ පුහුණු කරවනු පිණිස මේ ස්වාමීන්ද්‍රයන් විසින් ගලපනලද්දේය-මෙහි දක්වා තිබෙන ගාථා සමහරක් මාගධී ව්‍යාකරණ පොත් වලින් ගෙණ තිබෙන බවද සමහරක් සංස්කෘත ශ්ලෝක වලින් පෙරලා තිබෙන බවද හැඟේ—

මේ ග්‍රන්ථය වරනැගිලි ධාතු පාඨාදිය පුහුණු කරවූනැනට අපපරම්පරාවේ ස්ථවිරවරු ශිෂ්‍යයන්ට පුහුණු කරවති-මෙය පුහුණු කරණ ශිෂ්‍යයන්ට කදිම පටුනක් ලැබීම නියතමය—මීට කවුරුත් විසින්ද ලියනලද සන්නයක් ඇතත් එයිත් ආධුනිකයන්ගේ අභිමත සිද්ධිය නොවනු හෙයින් එයිනුත් උචිතමනා තැන් උපුටාගෙණ තවත් බොහෝමයක් වැදගත් කරුණු ඇතුළත් කොට බාලයන්ගේ ව්‍යුත්පත්තිය සඳහා අප විසින් මේ සන්නය ලියනලදී—තවත් මෙහි බොහෝ ග්‍රන්ථවල අදහස් ඇති සංස්කෘත ව්‍යාකරණයේ ශ්ලෝකයන් පාතින් නොව් ලකුණුවලින් පෙන්වා ඇත—

මේ ස්වාමීන්ද්‍රයන් විසින් සංග්‍රහ කරණලද සංස්කෘත පදභෙදයද ව්‍යාඛ්‍යාණය සහිතව මුද්‍රණය කර අවසාන වෙන්ට ළඟාස් තිබෙන බවද දන්වමු-මේ සඳහා අප ආචාර්යෝත්තමයන් වහන්සේගෙන් ආධාර ලැබුනු බවද නොමසුරුව මතක් කරම්හ—මෙහි අපගේ ප්‍රමාදාදියෙන්වූ යම්යම් දෝෂ ඇතත් සමාධිභජනය කිරීමෙන් නිර්දෝෂාර්ථයම සලකා ක්ෂමාශිංසනය කරම්හ—

# ගන්ථාරම්භ කථා

———0✳0———

1. පදභෙද විදුං බුද්ධං, පදභෙද පකාසකං
ධම්මං අරිය සංඝඤ්ච, නමස්සිත්වා පදප්පදං—

2. සුරම්මෙ ජගති ඛ්‍යාතෙ, පුප්ඵාරාමෙ පතිට්ඨිතෙ
විජ්ජොතනාසොභි පඤ්ඤාතෙ, පරිවෙණාධිසාමිනං—

3. සද්ධම්ම විනයෙ චෙව, භාසාසු සක්කතාදිසු
අතීව පටුතං පත්තං, කුසග්ග නිභ තිබ්බධිං—

4. උපනාටඨාදි මහාභික්ඛූ, රියවංස ධජව්හයං
ඤාණතිලක අඤ්ඤඤ්ඤඛ්‍යං, පණමිත්වා ගරුඤ්ච මෙ—

5. සප්පඤ්ඤ මුඛමාලොකන, සික්ඛා කාමෙන සාධුනා
සද්ධම්ම ජොතිපාලෙන, ගරුපාචරියෙන මෙ—

6. ඤාණනන්ද සමඤ්ඤෙන, මහාථෙරෙන ධීමතා
කතස්ස පදභෙදස්ස, බාලත්ථ වුද්ධි දීපිනො—

7. මමාචරිය මිත්තෙන, විඤ්ඤුනා කතවෙදිනා
පඤ්ඤාතිස්ස සමාව්හෙන, ථෙරෙන අභියාචිතො—

8. මති වුද්ධි පදං සාරං, සමාදාය තතො තතො
ව්‍යාඛ්‍යානං දීපනාසාය, කරිස්සාමි යථා බලං—

සන්නසහිත

# ප ද භෙ ද ය.

———0✻0———

## නමො තස්ස භගවතො අරහතො
## ස ම්මා ස ම්බු ද්ධ ස්ස.

1. පදං චතුබ්බිධං වුත්තං, නාමාඛ්‍යාතොපසග්ගජං
නිපාතජඤ්ච තඤ්ඤූහි, අස්සොබල්වභිධාවති*—

1. නාම, නාමපදය; ආඛ්‍යාත, ආඛ්‍යාත පදය; උපස ග්ගජං, උපසර්ගයෙන් උපන් පදය; නිපාතජඤ්ච, නිපාත යෙන් උපන් පදය දැයි; පදං, පදයතෙම; චතුබ්බිධං, සිව් වැදෑරුම් යයි; තඤ්ඤූහි, ඒපදය දන්නන් විසින්; වුත්තං, කියන ලද්දේය, අස්සො, අස්සය; බලු, බලුය; අභි, අභිය; ධාවති, ධාවතියි වේ—අස්සො, අශ්වතෙම; බලු, ඒකාන්ත යෙන්; අභි, මනාකොට; ධාවති, දුවයි—

(මෙහි "අස්සො,, යනු නාමපදය, "බලු,, යනු නිපාතපදය, "අභි,, යනු උපසර්ගපදය "ධාවති,, යනු ආඛ්‍යාත ක්‍රියාපදයි— " පජ්ජතෙ අත්ථො ගම්‍යතෙ එතෙනාති පදං,, (පදගතිම්හි) එතෙන, මේකාරණකොට ගෙණ; අත්ථො, අර්ථයතෙම; ප

---

* පදං චතුර්විධං ප්‍රොක්තං, නාමාඛ්‍යාතොපසර්ගජම්
නිපාතජඤ්ච ශබ්දඥෛ, රශ්වඃ බල්වභි ධාවති.

2. යං සබ්බ වචනං සබ්බ, ලිඞ්ගං සබ්බ විභත්ති යං
තං සබ්බඤ්ඤෙව නමතො, විදුං නාමන්ති තබ්බිදූ*—

ජ්ජනෙනසිසේසි, ශබ්දයතෙ ඉති, දන්නාලැබේ නුයි;පදං, පද නම්-“ අත්ථෙ නමතීති නාමං,, (නමනමනෙ)අත්ථෙ,අර්ථයන්කරා; නමති ඉති, නැමේනුයි; නාමං, නාමනම්—“ ක්‍රියං ආඛ්‍යාතීති ආඛ්‍යාතො ,, (ආ පුබ්බො ඛ්‍යාපකථනෙ) ක්‍රියං, (ගමනපචනාදි) ක්‍රියාව, ආඛ්‍යාතීති ඉති, කියානුයි; ආඛ්‍යාතො, ආඛ්‍යාත නම්—“ උපෙච්ච අත්ථං සජ්ජතීති උපසග්ගො ,, (උප පුබ්බො සජ විස්සග්ගෙ) උපෙච්ච, (ධාතුන්ගේ) සමීපයට පැමිණ; අත්ථං, අර්ථය; සජ්ජති ඉති, ප්‍රකාශ කෙරේ නුයි; උපසග්ගො, උපසග්ගනම්—“ උපසග්ගතො ජාතං උපසග්ගජං ,, උපසග්ගතො, උපසර්ගයෙන් ජාතං, වූයේ; උපසග්ගජං, උපසග්ගජ නම්—“ පදානමාදි මජ්ඣන්තෙසු නිපතතීති නිපාතො ,, (නි පුබ්බො පත පතනෙ) පදානං, පදයන්ගේ; ආදිමජ්ඣන්තෙසු, මුල මැද කෙළවර; නිපති ඉති; වැටේනුයි; නිපාතො, නිපාතනම්- “ නිපාතතො ජාතං නිපාතජං ,, නිපාතතො, නිපාතයෙන්; ජාතං, වූයේ; නිපාතජං, නිපාතජනම්)

2. යං, යමෙක් නෙම; සබ්බවචනං, සියළු වචන ඇත්තේද; යං, යමෙක්නෙම; සබ්බලිඞ්ගං, සියළු ලිඞ්ගඇත්තේද; සබ්බ විභත්ති, සියළු විභක්ති ඇත්තේද; තං, ඒ; සබ්බඤ්ඤෙව, සියළු අර්ථයන්කරා; නමනතො, නැමෙන හෙයින්; නාමං ඉති, නාමයයි; තබ්බිදූ, ඒ නාමය දන්නෝ; විදුං දනිත්—

(මෙහි සියළු වචන නම් ඒකවචන බහුවචනයි; සියළු ලි

* යත් ත්‍රිලිඞ්ගං ත්‍රිවචනං, සර්වාඤ්ච විභක්තිෂු
නමත්‍යර්ථෙෂු සර්වේෂු, තන්නාම කවයො-විදුඃ.

3. නාම නාමං සබ්බ නාමං, සමාසං තද්ධිතං තථා
කිතනාමඤ්ච නාමඤ්ඤූ, නාමං පඤ්චවිධං වදෙ †—

ගුනම් පුං ස්ත්‍රී නපුංසක ලිඟුයි—සියළු විභක්තිනම් ප්‍රථමා දි විභක්තීහුයි)—“ වුච්චති අනේනාති වචනං,; (ම ච බ්‍යක්තාවචනෙ) එනෙන, මේ කරණ කොට ගෙණ; අ ඤ්ඤො, අන්‍යයතෙම; වුච්චති ඉති, කියනුලැබේනුයි; වචනං, වචනනම—“ ලිනං පටිච්ඡන්නං අඞ්ගං අවයවොති ලි ඞ්ගං ,, ලිනංයීයේයි, පටිච්ඡන්නං, පිළිසන්වූ; අඞ්ගංයීයේයි අවයවොති, අවයවයනුයි; ලිඞ්ගං, ලිඞ්ගනම්.*—“ විභජ්ජී ති විභත්ති ,, (වි පුබ්බො භජ පෘථක්කරණෙ) විභජති ඉති, බෙදනුයි; විභත්ති, විභක්තිනම)

3. නාමනාමං, නාමනාමය; සබ්බනාමං, සර්වනාමය, සමාසං, සමාස නාමය; තද්ධිතං, තද්ධිතනාමය; තථා, එසේ ම; කිතනාමංච, කිතක නාමයද්දයි; නාමඤ්ඤූ, නාමය ද න්නාවූ පණ්ඩිතතෙමේ; නාමං, නාමය නෙමේ; පඤ්චවිධං, පස්වැදෑරුම් සයි; වදෙ, කියන්නේය—

(මෙහි නාමනාමනම් නාමමැයි—“ඝටපටාදිය,, දනුව—සර්වනාමනම්, ලිඞ්ගත්‍රයදරන්නාවූ සියල්ලන්වාමකවූ සබ්බා දි නාමයෝයි “සබ්බ කතර කතම,, යනාදිය දනුව-සමාස

* ලිඞ්ගනම් සැඟවූ අවයවයායි “ බුද්ධ රුක්ඛ,, යනාදි ශ බ්දවල ඒ සැඟවූ අවයවය කුමක්ද? “ බුද්ධො රුක්ඛො,, යි විභක්ති යෙදූකල මුලින්සිටි “ බුද්ධ රුක්ඛ ,, යන රූපය සැඟවී සිටියි, ඒ සැඟවන සවභාවඇති මුලින්සිටි රූපයසැ ඟවූ අවයව හෙයින් ලිඞ්ගනම් වේ—

† ඌණාද්‍යන්තානං කෘදන්තානඤ්ච, තද්ධිතාන්තානං සමාසජම් ශබ්දානුකරණශ්චෙති, නාම පඤ්චවිධං ස්මෘතම්—

**4. සමාසො පද සඞ්ඛෙපො, පදප්පච්චය සංහිතං**
**තද්ධිතං නාම කිතකං, ධාතුප්පච්චය සංහිතං—**

නාමනම් වෙන්වෙන්වූ අර්ථඇති පදයන්ගේ එකාර්ථවටයි: “මහාවීරො,, යනාදියදනුව-තද්ධිතනාමනම් පදප්‍රත්‍යයන්ගේ එකතුවීමයි. “වාසිට්ඨො,, යනාදියදනුව-කිතකනාමනම් ධාතුප්‍රත්‍යයන්ගේ එකතුවීමයි. “බුද්ධො,, යනාදිය දනුව-“නාමමෙව නාමං නාමනාමං,, නාමං එව, නාමයම; නාමං, නාමවූයේ; නාමනාමං, නාමනාම නම—“ බුද්ධාදීනං සබ්බෙසං වාචකං නාමං සබ්බනාමං,, බුද්ධාදීනං, බුද්ධාදීවූ; සබ්බෙසං, සියල්ලන්; වාචකං, වාචකවූ; නාමං, නාමය; සබ්බනාමං, සබ්බනාම නම— “ අත්ථතොච සද්දතොච සමාසීයතෙති සමාසො ,, (සං පුබ්බෝ අසුඛෙපනෙ) අත්ථතොච, අර්ථවශයෙන්ද; සද්දතොච, ශබ්ද වශයෙන්ද; සමාසීයතෙ ඉති, සමාසකරණු ලැබේනුයි; සමාසො, සමාසනම— “ තස්ස වසිට්ඨාදිකස්ස අත්ථස්ස හිතං තද්ධිතං ,, තස්ස, ඒ; වසිට්ඨාදිකස්ස අත්ථස්ස, වසිෂ්ඨාදිවූ අර්ථයට; හිතං, හිතවූයේ; තද්ධිතං, තද්ධිතනම—“ක්‍රියාලක්ඛණං කරොතීති කිතො ,, ක්‍රියාලක්ඛණං, ක්‍රියාලක්ෂණය; කරොති ඉති, කෙරේනුයි; කිතො, කිතනම—“කත්තාදයො කාරකෙ කරොන්ති වා කිතො ,, (කරකරණෙ) වා, නොහොත්; කත්තාදයො, කර්තෘ ආදිවූ; කාරකෙ, කාරකයන්; කරොන්ති ඉති, කෙරේනුයි; කිතො, කිතනම)

4. පද සඞ්ඛෙපො, පදයන්ගේ සංක්ෂෙපය තෙම; සමාසො, සමාස නම, පදප්පච්චය සංහිතං, පදයන්ගේ හා ප්‍රත්‍යයන්ගේ සම්බන්ධය තෙම; තද්ධිතං නාම, තද්ධිත නම, ධාතුප්පච්චය සංහිතං, ධාතුන්ගේ හා ප්‍රත්‍යයන්ගේ සම්බන්ධය තෙම; කිතකං, කිතක නම—

(සමාස නම් පදයන්ගේ සංක්ෂෙප වීමෙන් සිද්ධවන

5. පඨමා දුතියා තතියා, චතුත්ථී පඤ්චමී තථා
ඡට්ඨීච සත්තමී චෙති, මතා නාම විභත්තියො *

---

ශබ්දයි. " මහාවීරෙ-දීපඞ්කරො ,, යනාදියයි—තද්ධිත නම් පද ප්‍රත්‍යයන්ගේ සම්බන්ධ වීමෙන් සිද්ධවන ශබ්දයි; " භගවා-මක්ඛුමා ,, යනාදියයි—කිතක නම් ධාතු ප්‍රත්‍යයන් එක්වීමෙන් සිද්ධවන ශබ්දයි—" බුද්ධො-සඞ්ඝො ,, යනාදියයි )

5. පඨමා, ප්‍රථමා විභක්තියද; දුතියා, ද්විතීයා විභක්තියද; තතියා, තෘතීයා විභක්තියද; චතුත්ථී, චතුර්ථී විභක්තියද; පඤ්චමී, පඤ්චමී විභක්තියද; තථා, එසේම; ඡට්ඨීච, ෂෂ්ඨී විභක්තියද; සත්තමීච ඉති, සප්තමී විභක්තියදයි; නාම විභත්තියො, නාම විභක්තීහු; මතා, දත්තා ලද්දාහුය—

(" පඨමෙ භවා පඨමා ,, පඨමෙ, ආදියෙහි; භවා, වූවා; පඨමා, පඨමා නම-" ද්වින්නං පූරණී දුතියා ,, ද්වින්නං, දෙදෙනෙකුන්ගේ; පූරණී, පුරන්නී; දුතියා, දුතියා නම—"තිණ්ණන්නං පූරණී තතියා ,, තිණ්ණන්නං, තුන් දෙනෙකුන්ගේ; පූරණී, පුරන්නී; තතියා, තතියා නම—" චතුන්නං පූරණී චතුත්ථී ,, චතුන්නං, සතරදෙනෙකුන්ගේ; පූරණී, පුරන්නී; චතුත්, චතුර්ථී නම-" පඤ්චන්නං පූරණී පඤ්චමී ,, පඤ්චන්නං, පස්දෙනෙකුන්ගේ; පූරණී, පුරන්නී; පඤ්චමී, පඤ්චමී නම—" ඡන්නං පූරණී ඡට්ඨී ,, ඡන්නං, සයදෙනෙකුන්ගේ; පූරණී, පුරන්නී; ඡට්ඨී, ඡට්ඨී නම—" සත්තන්නං පූරණී සත්තමී ,, සත්තන්නං, සත් දෙනෙකුන්ගේ; පූරණී, පුරන්නී; සත්තමී, සප්තමී නම)

---

* ප්‍රථමා ච ද්විතීයා ච, තෘතීයා ච තථා ක්‍රමම්
චතුර්ථී පඤ්චමී ෂෂ්ඨී, සප්තමී චෙති තාඃ ස්මෘතාඃ.

**6. පච්චත්ත මුපයෝගඤ්ච, කරණං සම්පදානියං
නිස්සක්කං සාමි වචනං, භුම්ම මාලපනට්ඨමං**

---

6. පච්චත්තං, පච්චත්තය; උපයොගංච, උපයොගයද; කරණං, කරණය; සම්පදානියං, සම්ප්‍රදානය; නිස්සක්කං, නිස්සක්කය; සාමිවචනං, ස්වාමිවචනය; භුම්මං, භුම්මය; අට්ඨමං, අටවනුවූ; ආලපනං, ආලපනයයි (ක්‍රියා විභක්තිහු වෙත්)

(මෙහි පච්චත්තනම් ප්‍රථමා විභක්තියි—උපයොගනම් ද්විතීයා විභක්තියි—කරණනම් තෘතීයා විභක්තියි—සම්ප්‍රදාන නම් චතුර්ථී විභක්තියි—නිස්සක්ක නම් පඤ්චමී විභක්තියි—ස්වාමි විභක්තිනම් ෂෂ්ඨී විභක්තියි—භුම්මනම් සප්තමී විභක්තියි—ආලපන නම් ආමන්ත්‍රණ විභක්තියි— "කත්තුක්‍රියාහි උපයුජ්ජතං උපයොගො ,, (උපපුබ්බො යුජ්යොගෙ) කත්තුක්‍රියාහි, කත්තෘක්‍රියාවන්හා, උපයුජ්ජතං, යෙදීම; උපයොගො, උපයොගනම— "කරියතෙ අනෙනාති කරණං ,, (කරකරණෙ) අනෙන, මේ කරණ කොට ගෙණ; කරියතෙ ඉති, කරණු ලැබේනුයි; කරණං, කරණ නම— "යෙන වා කයිරතෙ තං කරණං ,, යෙන, යමක් කරණ කොටගෙණ; කයිරතෙ වා, කෙරේ නම් හෝ; කරණං, කරණ නම— "සම්මා පදීයතෙති සම්පදානං ,, (සං පුබ්බො, ප පුබ්බො, දා දානෙ) සම්මා, මනාකොට; පදීයතෙ ඉති, දෙනු ලැබේනුයි; සම්පදානං, සම්පදාන නම- "සංපෙච්ච අස්ස දදාතීති වා සම්පදානං,, සංපෙච්ච, සම්පයට පැමිණ; අස්ස, මොහට; දදාති ඉති වා, දේනුයී හෝ; සම්පදානං, සම්පදානනම— "සම්පදානමෙව සම්පදානියං ,, සම්පදානං එව, සම්ප්‍රදානයම; සම්පදානියං, සම්පදානිය නම—(මේ ස්වාර්ථයෙහි ඉයවූ නැතිගී) " නි (අප)ය

7. කම්මං කත්තා ච කරණං, සම්පදාන මථා පරං
අපාදානඤ්ච ආධාරෙ, ඉමෙ ඡ කාරකා මතා *—

ඝනනං නිස්සක්කනං ,, ( නි පුබ්බො, සක්ක ගමනෙ)
නි (අප) ස්සක්කනං, පහවීම; නිස්සක්කනං, නිස්සක්කන නම-
“ සං අස්ස අත්ථීති සාමී ,, සං, තෙමේ හෝ; ධනය හෝ; අ
ස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්නුයි; සාමී, සාමිනම—“ ය
ස්ස වා පරිග්ගහො තං සාමී ,, යස්ස, යමෙකුගේ; පරිග්ග
හො වා, අයිතිය හෝ වේද; තං, තේතොමේ; සාමී, සාමී
නම—“ සාමිස්සෙව වචනං සාමී වචනං ,, සාමිස්සෙව, ස්වාමි
යම; වචනං, වචනවූයේ, සාමිවචනං, සාමිවචනනම—
“ භවති එත්ථාති භුම්මං ,, එත්ථ, මෙහි; භවති ඉති, වේනු
යි; භුම්මං, භුම්මනම—“ අභිමුඛංකත්වා ලපනං ආලපනං ,,
( ආ පුබ්බො-ලප වචනෙ ) අභිමුඛං කත්වා, අභිමුඛකොට;
ලපනං, කථාකිරීම; ආලපනං, ආලපන නම)

7. කම්මං, කර්මකාරකයද; කත්තාච, කර්තෘ කාරකයද;
කරණං, කරණ කාරකයද; සම්පදානං, සම්ප්‍රදාන කාරක
යද; අථ, නැවත; අපරං, අන්‍යවූ; අපාදානංච, අපාදාන
කාරකයද; ආධාරෙ, ආධාර කාරකයද ( යන; ) ඉමෙ,
මොව්හු ඡ කාරකා, ෂට්කාරකයෝ යයි; මතා, දන්නා
ලද්දහුය—

(“ කරීයතෙති කම්මං ,, ( කර කරණෙ ) කරීයතෙ ඉ
ති, කරණු ලැබේනුයි; කම්මං, කර්මනම—“ යං කරොති
තං කම්මං ,, යං යමක්; කරොති, කෙරේද; තං, ඒ; ක
ම්මං, කර්මනම—“ ගමන පචනාදිකං ක්‍රියං කරොතීති ක
ත්තා ,, ( කර කරණෙ ) ගමන පචනාදිකං, ගමන පචනා

* කත්තා කම්මච කරණං, සම්ප්‍රදානං තථෛව ච
අපාදානා ධිකරණං, ඉච්චාහු කාරකානි ඡව්.

8 යත්‍ථ ක්‍රියාභි සම්බන්ධං, කාරකං කම්ම මුච්චතෙ*
යොජිතොවා නවාමුඛෙන, කත්‍තා යො කුරුතෙ ක්‍රියං.†

---

දිමු; ක්‍රියං, ක්‍රියාව; කරෙති ඉති, කෙරේනුයි; කත්තා, කර්තෘනම—"යො කරොති සකත්තා" ,, යො, යමෙක් තෙම; කරොති, කෙරේද; සො, හේතෙමේ; කත්තා, කර්තෘනම—"අපනෙත්‍වා ඉතො අ දදාතීති අපාදානං ,, (අප පූර්වා, ආ පූර්වා, දා දානෙ) අපනෙත්‍වා, පහකොට; ඉතො, මෙයින්; ආදදාති ඉති, ගණිනුයි; අපාදානං, අපාදානනම—"යස්මා දපෙති භයමාදත්තෙ වා තදපාදානං ,, යස්මා, යමක්හු කෙරෙන්; අපෙතිවා, පහවේනම්හෝ; භයංවා, භයවේනම්හෝ; ආදත්තෙවා, ගණීගම්හෝනං, ඒ; අපාදානං, අපාදානනම-"ආධාරො ක්‍රියං ධාරෙතීති ආධාරො,, ආසීසේස්සී ඝුසො, අභිශසින්; ක්‍රියං, ක්‍රියාව; ධාරෙති ඉති, දරානුයි; ආධාරො, ආධාර නම—" ආ ධාරියතීති වා ආධාරො ,, (ආ පූර්වා ධර ධාරණෙ) වා, තොහොත්; ආධාරියති ඉති, ආධාර කරණු ලැබේනුයි; ආධාරො, ආධාර නම—" කරොන්තීති කාරකා ,, කරොන්ති ඉති, කෙරෙත්නුයි; කාරකා, කාරකනම් වෙත්—( කරණ, සම්ප්‍රදාන යන ශබ්දව යේ විග්‍රහ වාක්‍යයෝ යටකියනලද්ද තසින් දතයුත්තා නුයි )

8. යත්‍ථ ක්‍රියාභි, කර්තෘ ක්‍රියාවන්හා; සම්බන්ධං, යුක්ත වූයේ; කම්මං කාරකං, කර්ම කාරකයයි; උච්චතෙ, කියනු ලැබේ; යො, යමෙක් තෙම; යොජිතො වා, යොදන ලද්දු ව හෝ; නවා, නොයොදන ලද්දුව හෝ; මුඛෙන, ප්‍රධානත්‍වූ

---

* තත්කර්ම ක්‍රියයා යත්‍ථ, විෂයී ක්‍රියතෙ තරාම්

† යඃ ක්‍රියාං ව්‍යාප්‍ය කර්තෘස්ථාං, කුරුතෙ මුඛ්‍ය භාවතඃ අප්‍රයුක්තඃ ප්‍රයුක්තො වා, ස කර්තා නාම කාරකම්

9. කරණං තං විසෙසෙන, යං ක්‍රියා සිද්ධි හෙතුකං*
සම්මා පදීයතෙ යස්ස, සම්පදානං තදුච්චතෙ†—

10. සමෙප්‍ය පගමෙ විනඝං, පුබ්බිරූපා ය දච්චුතං
වුච්චන්තෙ ත දපාදානං, අපරෙ වුද්ධි මබ්‍රවුං‡—

---

යේ; ක්‍රියං, ක්‍රියාව; කුරුතෙ, කෙරේද; (ඒ) කත්තා, කර්තෘ නාම—

( කර්තෘ ක්‍රියාවන්හා යුක්තවූ පදය කර්මකාරක නම, යොදන ලදුව හෝ නොයොදනා ලදුව හෝ ප්‍රධානවූයේ ක්‍රියාව කෙරේද ඒ කර්තෘ කාරක නම—මෙහි යොදන ලදුව කිරීමනම් අනිකෙක්හුගේ ප්‍රයොගයක් ඇතිව කිරීම යි—නොයොදන ලදුව කිරීමනම් අන්‍ය ප්‍රයොගයක් නැතිව කිරීමයි දතයුතු)

9. යං, යමක්; විසෙසෙන, විශෙෂයෙන්; ක්‍රියා සිද්ධි හෙතුකං, ක්‍රියාවගේ සිද්ධියට කාරණ වූයේද; තං, ඒ; කරණං, කරණකාරක නම—යස්ස, යමෙක්හට; සම්මා, මනාකොට; පදීයතෙ, දෙනුලැබේද; තං, ඒ; සම්පදානං, සම්ප්‍රදාන කාරකයයි; උච්චතෙ, කියනු ලැබේ—

( යමක් විශෙෂයෙන් ක්‍රියාවගේ නිපදවීමට කාරණවේනම් ඒ කරණ කාරක නම—යමෙකුට මනාකොට දෙනු ලැබේනම් ඒ සම්ප්‍රදාන කාරකනම )—

10. අපගමෙ, පහවීම; සමෙ අපි, සමවූකල්හිද; විනඝං (වස්තූන්) දෙදෙනෙක්හුගේ අතුරෙහි; යං, යම් වස්තුවෙක් තෙම; පුබ්බිරූපා, පූර්වරූපයෙන්; අච්චුතං, නොපිරිහීද; තං, ඒ; (වස්තුව) අපාදානං, අපාදාන කාරක

---

* ක්‍රියා නිෂ්පාද්‍යතෙ යෙන, කරණං තදුදාහෘතම්

† සම්ප්‍රදානං තදාඛ්‍යාතං, යස්මෛ සම්‍යක් ප්‍රදීයතෙ

‡ යදපාදීයතෙ ධ්‍රුවං, තදපාදාන මුච්‍යතෙ.

11 කිරියා කත්තු කම්මඨං, ආධාරියති යෙන සො
ආධාරොති පවුච්චතෙසො, ඔකාසොතිපි වුච්චති*—
12 එතෙ සම්බන්ධියො වෙති, යස්මා ත්‍යා බුද්ධි ජායතෙ
සම්බන්ධො නාම සො අඤ්ඤො,සම්බන්ධිවය නිස්සිතො†

---

යයි; වුච්චතෙ, කියනුලැබේ; අපරෙ, සමහරු; අවධිං, අවධිම්හි ( ද ) අබ්‍රවුං, කීහු—

( මෙහි අධිප්‍රාය නම් යම් වස්තූන් දෙදෙනෙක්හුගේ පනවීමක් ඇති කල්හි පූර්‍වාවරූපයෙන් නොගිලී සිටි වස්තුව අපාදාන නම්-හේ මෙසේයි-" ගාමා අපෙතාභිමුනයො ,, යි මුනිහු ගමෙන් පහවෙත් යයි කීකල ගම පූර්‍වාවරූපයෙන් සිටියේය, එහෙයින් ගම අපාදාන නම්-අවධි නම් සීමායි)

11. කත්තු කම්මඨං, කර්‍තෘ කර්‍ම දෙදෙනා කෙරෙහි සිටියාවූ; කිරියා, ක්‍රියානොමෝ; යෙන, යමෙක්. විසින්; ආධාරියති, ආධාර කරණුලැබේද; සො, හේතෙමේ; ආධාරො ඉති, ආධාර කාරක යයි; පවුච්චතෙ, කියන ලද්දේය; සො, ඒ ආධාර කාරක තෙමේ; ඔකාසොඉති අපි, ඔකාස කාරක යයිද; වුච්චති, කියනුලැබේ—

(කර්‍තෘ කර්‍ම දෙක්හි පිහිටි ක්‍රියානොමෝ යමෙක් විසින් ආධාර කරණුලැබේද ඒආධාරකාරකනම-ඒආධාරකාරකය ඔකාස කාරකයයිද කියනුලැබේ—"යොධාරොතමොකාසං,,යො,යමෙක්තෙමේ;ආධාරො,ආධාරද,තං,හේතෙමේ;ඔකාසං,ඔකාසකාරකනම)—

12 යස්මාත්‍යා;නම් අර්‍ථයක් හෙතුකොට ගෙණ;එතෙ

---

* ආධාර කාරකං ප්‍රාහුඃ, තං චතුර්විධ මෙවච
ආධාර යති යඃ කර්‍තෘ, ව්‍යාපෙක්‍ෂා ව්‍යාපාර සද්මනි.

† සම්බන්ධඃ කාරකෙ භ්‍යොන්‍යඃ, ක්‍රියාකාරක පූර්‍වකඃ
ශ්‍රැතායා ම ශ්‍රැතායාංඤු, ක්‍රියායාං සො භිධියතෙ.

13. සම්මුඛා භි මුඛං කත්වා, ලපනං වත්ථුනො පන
විජ්ජමානස්සාලපනං, වුත්තමා මන්තණනිති—

14. යදා කත්තරි පඨමා, දුතියා කම්මණි තදා,
යදා කත්තරි තතියා, පඨමා කම්මණි තදා,*—

නව, මේඩ්‍යාතුනු දෙදෙනා; සම්බන්ධිනොති, සම්බන්ධ ඇත්තා-හුයි; බුද්ධි ජායතෙ, බුද්ධි උපදීද; සම්බන්ධිවය, ඒ සංයුක්තයන් දෙදෙනා, නිස්සිතො, ඇසුරුකළාවූ; සො අඤ්ඤො, ඒඅණිය නෙම; සම්බන්ධො නාම, සම්බන්ධ නම්—

(සම්බන්ධීයතීති සම්බන්ධො, (සංපුබ්බො-බන්ධබන්ධනෙ) සම්බන්ධියති ඉති, සම්බන්ධ කරණලැබේ නුයි සම්බන්ධො, සම්බන්ධ නම; අඤ්ඤමඤ්ඤ පෙක්ඛ ලක්ඛණො සම්බන්ධො, සම්බන්ධො, සම්බන්ධනම්; අඤ්ඤමඤ්ඤ පෙක්ඛා ලක්ඛණෙ, මවුනොවුන් අපෙක්ෂාකරණ ලක්ෂණ ඇත්තේය-මෙන්වෙන් වපැණෙන වස්තූහු දෙදෙනෙක්, සමහරකලෙක එක්වපවාත්නාහුනම් උන් එක්වූහ යනබුද්ධිය උපදනේ සම්බන්ධ බලයෙනි ඒ සම්බන්ධයද එක්වූ වස්තූන් දෙදෙනා කෙරෙන් එක්වස්තුවෙහි පිහිටියේ නොවෙයි, ඒ වස්තු දෙදෙනා කෙරෙහිම පිහියේයි යේයි)

13. විජ්ජමානස්ස වත්ථුනො පන, ඇත්තාවූ වස්තුවක්හට වනාහි; සම්මුඛා, ශබ්දයෙන්; අභිමුඛං කත්වා; අභිමුඛකොට; ලපනං, කථාකිරීම; ආලපනං, ආලපන නම්, ආමන්තණං ඉතිච, ආමන්ත්‍රණයයිද; වුත්තං, කියනලද්දේය.

(ඇති වස්තුවක්හට වනාහි ශබ්දයෙන් අභිමුඛ කොට කථාකිරීම ආලපන නම ඒ ආමන්ත්‍රණයයිද කියනලදී)

“ අභිමුඛං කත්වාලපනං ආලපනං ,, (ආ පුබ්බො, ලපවචනෙ) අභිමුඛං කත්වා, අභිමුඛ කොට; ලපනං, කථාකිරීම; ආලපනං, ආලපන නම—

14. යදා, යම්කලෙක්හි; කත්තරි, කර්තෘ කාරකයෙහි;

* යදා කර්තෘ ප්‍රථමාන්තඃ, කර්මණි ද්විතීයා තදා
යදා කර්තෘ තෘතීයාන්තඃ කර්මණි ප්‍රථමා තදා.

15. අභිහිතෙ කත්තරි ඤෙය්‍යා, පඨමා සාධනඤ්ඤුනා
දුතියා වා ථවා ඡට්ඨී, කම්මණී සබ්බදා සියා *–
16. අභිහිතෙ කම්මණි ඤෙය්‍යා, පඨමා සාධනඤ්ඤුනා
තතියා වා ථවා ඡට්ඨී, කත්තරි සබ්බදා සියා–

පඨමා, ප්‍රථමා විභක්ති වන්නීද; තදා, එකල්හි; කම්මණි, කර්මකාරකයෙහි; දුතියා, විතීයා විභක්ති වන්නීය; යදා, යම්කලෙක්හි; කත්තරි, කර්තෘකාරකයෙහි; තතියා, තෘතීයා විභක්ති වන්නීද; තදා, එකල්හි; කම්මණි, කර්මකාරකයෙහි; පඨමා, ප්‍රථමා විභක්ති වන්නීය–

(යම්කලෙක්හි කර්තෘකාරකයෙහි ප්‍රථමා විභක්තිවේද එකල්හි කර්මකාරකයෙහි විතීයා විභක්තිවේ- යම්කලෙක්හි කර්තෘකාරකයෙහි තෘතීයා විභක්තිවේද එකල්හි කර්මකාරකයෙහි ප්‍රථමා විභක්තිවේ- "බුද්ධො ධම්මං දෙසෙති,, "රාජා සත්තුංපසහති,, යනාදියද "බුද්ධෙන ජිතො මාරො,, "රඤ්ඤා හතො වෙරී ,, යනාදියද මීට නිදර්ශනයි)

15. අභිහිතෙ කත්තරි, කර්තෘ උක්ත කල්හි; සාධනඤ්ඤුනා, කාරක දන්නවුන් විසින්; පඨමා, ප්‍රථමා විභක්ති තොමෝ; ඤෙය්‍යා, දතයුත්තීය; කම්මණි, ( අනුක්ත ) කර්මයෙහි; දුතියා වා, විතීයා විභක්ති හෝ; අථවා, නොහොත්; ඡට්ඨී, ෂෂ්ඨී විභක්ති හෝ; සබ්බදා, හැමකල්හි; සියා, වන්නීය–

( කාරක දන්නා විසින් කර්තෘ කාරකය උක්තකල්හී ප්‍රථමා විභක්ති දතයුත්තීය-කර්මය අනුක්ත කල්හි හැමකල්හි විතීයාවිභක්ති හෝ ෂෂ්ඨි හෝ වේ )—

16. කම්මණි අභිහිතෙ, කර්මය උක්ත කල්හි සාධනඤ්ඤුනා, කාරක දන්නවුන් විසින්; පඨමා, ප්‍රථමා විභක්ති

* ප්‍රථමෛව විභක්තිඃස්‍යාත්, දුක්තෙ කර්තරි කර්මණි
අනුක්තෙ කර්තෘ කර්මාදෞ, ව්තීයාද්‍යාඃ විභක්තයඃ

17 යාව පදවයං තිස්සුවි, සම්බන්ධ මුපලබ්භතෙ
විසෙසණ විසෙස්සත්තං, ගම්‍යතෙ තණ්ණි කාමතො*—

නො මෙ; පෙදයත; දන පුරාහිය; කනකර්, (අනුක්ත)ක
තෘයෙනි; තහියාවා, තෘතීයා විභක්ති හෝ; අථවා, හො
නොහ්; ඡට්ඨි, ෂෂ්ඨිවිභක්තිහෝ; සබ්බදා, හැමකල්හි; දිස්සා,
වන්නිය; —

( කර්ම උක්ත කල්හි ප්‍රථමා විභක්ති වේ කතෘ අනුක්ත කල්හි තෘතීයා විභක්ති හෝ ෂෂ්ඨී විභක්ති හෝ වෙයි)

17 යාව, යම්බඳුවූ; තිස්සුවි පදවයං, තිසිපදදෙකෙන්; සම්බන්ධං, සම්බන්ධවූයේ; උපලබ්භතෙ, දන්නා ලැබේද; තණ්ණි, ඒ දෙපදයෙහි; විසෙසණ විසෙස්සත්තං, විශෙෂණ විශෙෂ්‍යභාව නෙම; කාමතො, කැමිති පරිද්දෙන්; ගම්‍යතෙ, හැගේ—

( “නීලුප්පලං ,, යන්නෙහි “ නීල-උප්පල ,, යනපදයෝ දෙදෙනා උප්පලාඛ්‍ය එක ජලජ වස්තුවෙක්හි පවත්නානයි ඔවුනොවුන් හා සම්බන්ධයහ-මෙහි සෙවන රක්තාදි ගුණයට සාමාන්‍යවූ උත්පලද්‍රව්‍යය සෙවනාදින්කෙරෙන් වෙනස්කොටසිටිනා නීලගුණයඋත්පල ද්‍රව්‍යයටවිශෙෂණ වෙයි—වැලිඳුභෘඞ්ගාදි ද්‍රව්‍යයන්ට සාධාරණවූනීලගුණයඒ භෘඞ්ගාදින් කෙරෙන් වෙනය් කොට සිටිනුයී උත්පලයද නීලගුණයට විශෙෂණවෙයී—මෙසේ විශෙෂණ විශෙෂ්‍ය භාවය විවක්‍ෂා හෙයින් වෙයි දතයුතු—“ විසෙසෙති එතෙනාති විසෙසණං ,, (වි පුබ්බො-සිස විසෙසණෙ) එතෙන, මේ කරණ කොට ගෙණ; විසෙසෙති ඉති, වෙසෙසානුයී; විසෙසණං, විසෙසණ නම්—“ විසෙසීයතෙනි විසෙ

* ව්‍යවච්ඡෙද්‍යං විශෙෂ්‍යං සත, ව්‍යවච්ඡෙදක මන්‍යතු
තද්විශෙෂණ මාධ්‍යානං, රාමො දසරථි යථා.

18. යස්මාති යබ්භෙද බුද්ධි, හොති නං තබ්බිසෙසණං
තස්ස ජාති ගුණ ක්‍රියා, දබ්බං නාමනානෙකධා——

---

සනං ,, විසෙසීයතෙන ඉති, වෙසසනු ලැබේනුයි; විසෙසනං, විසෙසන නම්)—

18, යස්මාති, යමක් හෙතුකොට ගෙණ, යබ්භෙද බුද්ධි, යමෙකුගෙන් වෙනසෙති බුද්ධිය; හොති, වේද; නං, ඒ හෙතුවූ දෙය; තබ්බිසෙසණං, එයට විශෙෂණ වෙයි; තං ච, ඒ විශෙෂණයද; ජාති, ජාතිය; ගුණ, ගුණය; ක්‍රියා, ක්‍රියාය; දබ්බං, ද්‍රව්‍යය; නාමං ඉති, නාමයයි; අනෙකධා, නොයෙක් පරිද්දෙන් වෙත්——

(යමක් හෙතුකොට ගෙණ යමක්හුගේ වෙනසෙති බුද්ධියවේද ඒ ඊට විශෙෂණවේ. ඒ විශෙෂණය ජාති විශෙෂණය ගුණ විශෙෂණය ක්‍රියා විශෙෂණය ද්‍රව්‍ය විශෙෂණය නාම විශෙෂණ යයි කියා නොයෙක් වැදෑරුම්වේ—"සකල ඛණ්ඩ මුණ්ඩාදි ව්‍යත්ත න්‍යායී ගොත්තාදි සාමඤ්ඤං ජාති ,, සකල ඛණ්ඩ මුණ්ඩාදි, සියළු ඛණ්ඩය මුණ්ඩය යනාදිවූ; ව්‍යත්තනුයායී, විශෙෂය අනුවයන්නාවූ; ගොත්තාදි, ගොබව යනාදිවූ; සාමඤ්ඤං, සාමාන්‍යය; ජාති, ජාතිනම—"දබ්බනිස්සිතො නීලාදිකො ගුණො,, දබ්බනිස්සිතො, ද්‍රව්‍යය ඇසුරු කළාවූ; නීලාදිකො, නීලාදිය; ගුණො, ගුණනම—(ක්‍රියා ලක්ෂණය "අඥබ්බභූතං,, යනාදියෙන් මතු කියන්නේයි)—"ජාත්‍යාදීන මාධාරෙ දබ්බං,, ජාත්‍යාදීනං, ජාතිආදින්ට; ආධාරෙ, ආධාරවූයේ; දබ්බං, ද්‍රව්‍ය නම—"පවත්ති නිවුත්ති සඞ්ඛාත වොහාරණ්ණං කරීයමානො සඞ්කෙතො නාමං,, පවත්ති නිවුත්ති සඞ්ඛාත, ප්‍රවෘත්තිනිවෘත්තියයි කියනලද; වොහාරණ්ණං, ව්‍යවහාරය පිණිස; කරීයමානො, කරණුලබන්නාවූ; සංකෙතො, සලකුණ; නාමං, නාමනම-ව්‍යවහාරයෙනමේ ප්‍රවෘත්තිලක්ෂණ

19 යථා ගො ධවලො ගන්තා, විසාණී දෙව්දත්තකො
විසෙසණං විධා හොති, තුල්‍යභින්නහයභෙදතො*—

නෝ නිවෘත්ති ලක්‍ෂණ හෝ වත්මුත් අනිත්‍යපරිද්දකිත්නැති- “ඝටං ආහර,, සීනිකල කළයගෙණෙනබුවෙහිපුරුෂයා පවත්නා හෙයින් ඒව්‍යවහාරය ප්‍රවෘත්ති ලක්‍ෂණ නම-“ඝටං නාහර,, සීනිකල පුරුෂයා කළය ගෙණෙනබවෙහි නොපැවත වලක්නා හෙයින් ඒ ව්‍යවහාරය නිවෘත්ති ලක්‍ෂණ නාම-මෙසේ ප්‍රවෘත්ති නිවෘත්තියයි ද්විප්‍රකාරවූ ව්‍යවහාරනම් ඝටඝ පටය යනාදි සංකෙත යෙක් නැත්නම් නොපවත්නේය—ඒ එබඳුවූ ව්‍යවහාරය එකෙක්ම කායිකය වාචසිකය මානසික යයි ත්‍රිවිධවේ—මෙනැත්හි ඝටය ඇතැයි ගමනාගමනාදි කයින් වනහෙයින් ව්‍යවහාරය කායිකනම—නොපලෙත් ඝටයා ඇතැයි පැවැත්ම වාචසික නම—සිතින්ඇතැයි ගැන්ම මානසිකනම්,)

19 යථා, මෙසේනි; ගො, ගොන්නෙම්; ධවලො, සුදුය; ගන්තා, යෙයි; විසාණී, අංඇත්තෝය; දෙව්දත්තකො, දෙවදත්තනම්; විසෙසණං, විශෙෂණය; තුල්‍යභින්නහය භෙදතො, තුල්‍යාධිකරණ භින්නාධි කරණ ප්‍රභෙදයෙන්; විධා හොති, දෙපරිද්දකිත්වේ—

(මෙහි ගොත්ව ලක්‍ෂණවූ ජාතිය හෙතු කොට ගෙණ අශ්වාදි ද්‍රව්‍ය සමුදායෙන් ගො ද්‍රව්‍යයෙහි වෙනසයන බුද්ධිය උපදනා හෙයින් ගොත්ව ජාති නොමෝ සාස්නාදි මත්වූ ඛණ්ඩ මුණ්ඩාදි ගොද්‍රව්‍යයට විශෙෂණ වෙයි—ධවලත්ව ගුණය නොම මිවක්‍ෂිත ගොද්‍රව්‍යය නීලාදි ගො ද්‍රව්‍යයෙන් වෙනස්කරණ හෙයින් විශෙෂණ වෙයි—“ගන්තා,, යන නත්හි ගමන ක්‍රියාව “ තිට්ඨ-ගච්ඡ ,, යනාදි ගොය දෘෂ්ටියෙන් වෙනස් කරණ හෙයින් ද්‍රව්‍යයට විශෙෂණවෙ

* විශෙෂණං විධා තුල්‍ය, භින්න භෙද නතො නමෙව්—

20. භින්නප්පවත්ති නිමිත්තා, සද්දා, එකත්ථ වුත්තිනො
පවත්තා තුල්‍යාධිකරණා, භින්නාධිකරණා පරෙ—

21. තතියා චෙව ඡට්ඨී ච, සත්තමී චෙති භෙදතො
භින්නාධිකරණං තඤ්ඤ, තිවිධන්ති විජානියං *—

---

සී—විශේෂණ ලක්ෂණවූ ගොද්‍රව්‍යය විශේෂණ රහිතවූ ගොද්‍රව්‍යයෙන් වෙනස් කරණ හෙයින් විවක්ෂිත ගොද්‍රව්‍යයට විශේෂණයි—දෙවදත්ත යන නාමය යඤ්ඤදත්තාදි නමින් යුක්තවූ ගොද්‍රව්‍යයෙන් වෙනස් කෙරේනුයි විවක්ෂිත ගොද්‍රව්‍යයට විශේෂණයි-මෙසේ ගොයනාදිය ජාත්‍යාදින්ට ක්‍රමයෙන් උදාහරණයි-විශේෂණය තුල්‍යාධිකරණ විශේෂණය භින්නාධි කරණ විශේෂණ යයි කියා ද්විප්‍රභෙදවේ)

20. භින්නප්පවත්ති නිමිත්තා, වෙන්වීම නිමිත්ත කොට ඇති; සද්දා, ශබ්දයෝ; එකත්ථ වුත්තිනො, එක් වස්තුවෙක්හි; පවත්තා, පැවැත්තාහු; තුල්‍යාධිකරණා, තුල්‍යාධි කරණනම් වෙත්; අපරෙ, (මෙයින්) අන්‍යවූවාහු; භින්නාධි කරණා, භින්නාධි කරණ නම්වෙත්—

(වෙන්වීම නිමිති කොට ඇති ශබ්දයෝ එක් වස්තුවෙක්හි පැවැත්තාහු තුල්‍යාධි කරණ නම්වෙත්, මෙයින් අන්‍යවූවාහු භින්නාධි කරණ නම්වෙත්)—

21. තතියාචෙව, තෘතීයාවද; ඡට්ඨීච, ෂෂ්ඨීයද; සත්තමී චෙති, සප්තමීයද (යන;) භෙදතො, ප්‍රභෙද හෙයින්; තඤ්ඤ, එනි; භින්නාධිකරණං, භින්නාධි කරණය තෙම; තිවිධං ඉති, ත්‍රිවිධයයි; විජානියං, දතයුත්තේය—

(තෘතීයා විභක්ති භින්නාධි කරණ විශේෂණය, ෂෂ්ඨී විභක්ති භින්නාධි කරණ විශේෂණය, සප්තමී විභක්ති භින්නාධි කරණ විශේෂණ යයි කියා භින්නාධිකරණ විශේෂණය තුන්ප්‍රකාර වේ—“ ගොණෙනන ගොනමො-රඤ්ඤො පුත්තො-ගඞ්ගායං ඝොසො,, යනාදිය මිටනිදර්ශනයි)

---

* තෘතීයා චෙව ෂෂ්ඨී ච, සප්තමී චෙති තත් ත්‍රිධා—

22. ක්‍රියා විසෙසණං යාව, තං සබ්බං හි නපුංසකෙ
සියා ච එකවචනං, යථා භික්ඛූ සුඛං සිනා * —

23. යං තිකාලං තිපුරිසං, ක්‍රියාවාචි තිකාරකං
අත්‍රිලිඞ්ගං ද්විවචනං, තදාඛ්‍යාතන්ති වුච්චතෙ† —

---

22. ක්‍රියා විසෙසණං, ක්‍රියා විශෙෂණයා නොමේ; යාව, යම්පමණෙකින්ද; තං සබ්බංහි, ඒ සියල්ලම; නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි වේ; එකවචනංච සියා, එකවචනද වේ; යථා, මෙසේයි; භික්ඛූ, භික්ෂූහු; සුඛං, සුවසේ; සිනා, සිටියෝයි.

(මෙහිදු " සිනා,, කීකල "ඨානං කතවන්තො ,, යෙයි ස්ථානක්‍රියාව කළහ යන අර්ථයි—කෙසේවූ ස්ථානක්‍රියාව කෙළේදයි අපෙක්ෂාවක් ඇතිකල්හි සුඛවූ ස්ථානක්‍රියාව යයි අපෙක්ෂා කළකල්හි " සුඛං ,, යනු " ඨානං,, යන්න ට විශෙෂණවන හෙයින්ද සුඛ ශබ්දයෙන්ද ඨාන ශබ්දයෙන්ද එකම ස්ථිති ක්‍රියාව කියනලබන හෙයින් සුඛශබ්ද ඨානශබ්ද දෙදෙනා තුල්‍යාධි කරණ හෙයින් ද විශෙෂ්‍යාපේ ක්ෂාවී " ඨානං ,, යන මේ පදයෙහිවූ නපුංසකත්වයද එක වචනයද සුඛශබ්දය ලබයි)—

23 යං, යම්පදයක්; තිකාලකං, කාලත්‍රයක් ඇත්තේද; තිපුරිසං, පුරුෂත්‍රයක් ඇත්තේද; ක්‍රියාවාචී, ක්‍රියාවාචකද; තිකාරකං, කාරකත්‍රයක් ඇත්තේද; අත්‍රිලිඞ්ගං, ලිඞ්ගත්‍රයක් නැත්තේද; ද්විවචනං, වචනද්වයක් ඇත්තේද; තං, හේතෙම; ආඛ්‍යාතං ඉති; ආඛ්‍යාතයයි; වුච්චතෙ, කියනු ලැබේ—

(මෙහි කාලත්‍රය නම් භූත භවිෂ්‍යත් වර්තමාන යන තුන්

---

* ක්‍රියා විශෙෂණං කර්ම, නපුංසක මිත්‍යිෂ්‍යතෙ
යථා නිශශබ්දකමනිශං, ලඞ්කාං රාමො විලොකතෙ

† යත්ත්‍රිකාලං ත්‍රිපුරුෂං, ක්‍රියාවාචි ත්‍රිකාරකම්
අත්‍රිලිඞ්ගං ද්විවචනං, තදාඛ්‍යාතං ප්‍රචක්ෂ්‍යතෙ

24. භූවාදී ච රුධාදී ච, දිවාදී ස්වාදයො ගණා
කියාදී ච ගහාදී ච, තනාදී ච චුරාදයො *—

කාලයි—පුරුෂත්‍රය නම් ප්‍රථම මධ්‍යම උත්තම යන පුරුෂත්‍රණයි—ක්‍රියාවාචක නම් ක්‍රියාව ප්‍රකාශ කොට ඇති බවයි—කාරකත්‍රය නම් කර්තෘ කර්ම භාව යන කාරක ත්‍රණයි—ලිඞ්ගත්‍රයක් නැත්තේනම් පුරුෂ ස්ත්‍රී නපුංසක යන තුන්ලිඟු නැතිබවයි—වචන දෙකක් ඇත්තේ නම් එකවචන බහුවචන යන වචනදෙක ඇතිබවයි—“ රත්තිං දිවානං පරිච්ඡෙදං ගච්ඡති එතෙනාති කාලො,, එතෙන, මේ කරණකොට ගෙණ; රත්තිං දිවානං, රෑදවල් යන මොවුන්ගේ; පරිච්ඡෙදං, පිරිසිඳීමට, ගච්ඡති ඉති, යේනුයි; කාලො, කාලනම—“ තයො කාලා සමාහටා තිකාලං ,, තයො කාලා, කාලයෝ තුන්දෙනෙක්; සමාහටා, එක්කොට සලකණ ලද්දාහු; තිකාලං, තිකාල නම—“. මාතාපිතූනං හදයං පූරෙතීති පුරිසො ,, (පූර පූරණෙ) මාතාපිතූනං, මව්පියන්ගේ; හදයං, සිත; පූරෙති ඉති, පුරවාතුයි; පුරිසො, පුරිසනම—“ ක්‍රියං වාචෙති සීලෙනාති ක්‍රියාවාචී (ක්‍රියා ශබ්දාප පද වච ධ්‍යත්‍යාවචනෙ) සීලෙන, ස්වභාවයෙන්; ක්‍රියං, ක්‍රියාව; වාචෙති ඉති, කියාතුයි; ක්‍රියාවාචී ක්‍රියාවාචී නම— තිපුරිසං-තිකාරකං යනාදිය “තිකාල ,, ශබ්දය මිශ්‍රග කල්‍යාගේ දනායුතුයි)

24. භූවාදීච, භූවාදි ධාතුහුද; රුධාදීච, රුධාදි ධාතුහුද; දිවාදී, දිවාදි ධාතුහුද; ස්වාදයො, ස්වාදි ධාතුහුද; කියාදීච, කියාදි ධාතුහුද; ගහාදීච, ගහාදි ධාතුහුද; තනාදීච, තනාදි ධාතුහුද; චුරාදයො, චුරාදි ධාතුහුද (යන මොහු;) ගණා, ධාතු ගණයෝයි—

* භවාද්‍යදාදී ජුහොත්‍යාදි, ර්දිවාදිඃ ස්වාදිරෙවච
තුදාදිශ්ච රුධාදිශ්ච, තනක්‍ර්‍යාදි චුරාදයඃ.

25. වත්තමානා පච්චුප්පන්නෙ, භවිස්සන්ති අනාගතෙ
පඤ්චමී සත්තමී තීසු, අතීතෙ හොන්ති සෙසකා—

26. පඤ්චමී සත්තමී වත්ත, මානා සම්පති නාගතෙ
භවිස්සන්ති පරොක්ඛාදී, වත්තන්තෙ'තීතකාලිකා—
මාන භෙදෙ.

---

(භූවාදි ගණය, රුධාදි ගණය, දිවාදි ගණය, සවාදි ගණය, කියාදි ගණය, ගහාදි ගණය, තනාදි ගණය, චුරාදි ගණයයි කියා ධාතු ගණයෝ අටදෙනෙක් වෙති * "ක්‍රියං ධාරෙතීති ධාතු (ධා ධාරණෙ) ක්‍රියං, ක්‍රියාව; ධාරෙති ඉති, දරනුයී; ධාතු, ධාතු නම්)

25. වත්තමානා, වත්මාන විභත්ති හොතෙ; පච්චුප්පන්නෙ, ප්‍රත්‍යුත්පන්න (කාල) යෙහිවේ; භවිස්සන්ති, භවිස්සන්ති විභක්ති හොතෙ, අනාගතෙ, අනාගත (කාල්) යෙහි වේ; පඤ්චමී, පඤ්චමී විභක්තිද; සත්තමී, සප්තමී විභක්තිද; තීසු, තුන්කල්හි වේ; සෙසකා, සෙසු (පරොක්ඛාදී) විභක්තිහු; අතීතෙ හොන්ති, අතීතකාලය ඇත්තාහු වෙත්—

(වර්තමාන විභක්තිය වර්තමාන කාලයෙහි වේ, භවිස්සන්ති විභක්තිය අනාගත කාලයෙහි වේ, පඤ්චමී විභක්තියද සප්තමී විභක්තියද අතීත අනාගත වර්තමාන යන තුන්කාලයෙහි වේ, සෙසු පරොක්ඛා හීයත්තනී අජ්ජතනී කාලාතිපත්ති යන සතර විභක්තිහු අතීත කාලයෙහි වෙති- ඃ පටිච්ච උප්පජ්ජතීති පච්චුප්පන්නො ,, (පති-උ පුබ්බො පදනතිම්හි ) පටිච්ච, නිසා; උප්පජ්ජති ඉති, උපදීනුයී; පච්චුප්පන්නො, පච්චුප්පන්න නම් )

26. පඤ්චමී, පඤ්චමී විභක්තියද; සත්තමී, සප්තමී විභ

---

* සමහර තැනෙක්හි "ගහාදි ධාතුගණය හැර දමා ධාතු ගණයෝ සත් දෙනෙකැයි කියන ලදී—

27. කාලො අතීත වත්තමානා, නාගතා ක්‍රිය ලක්ඛණෙ
පච්චුප්පන්නො මතො කාලො, ආරද්ධානිට්ඨිතෙ ක්‍රියෙ

---

ක්තියද; වත්තමානා, වර්තමාන විභක්තියද යනමොහු; ස
ම්පති, වර්තමාන කාලයෙහි වෙත්; භවිස්සන්ති, භවිස්ස
න්ති විභක්ති නොමෝ; අනාගතෙ, අනාගත කාලයෙහි
වේ, පරොක්ඛාදී, පරොක්ෂා විභක්තිය ආදිකොට ඇති; ම
තාසො, විභක්ති සතර දෙනා; අතීත කාලිකා, ඉකුත්කා
ල් ඇත්තාහු වෙත්—

මත භෙද යයි—

(පඤ්චමී විභක්තියද සප්තමී විභක්තියද වර්තමාන විභ
ක්තියද වර්තමාන කාලයෙහි වෙති—භවිස්සන්ති විභක්ති
ය අනාගත කාලයෙහි වේ—පරොක්ෂා හීයත්තනී අජ්ජත
නී කාලාතිපත්ති යන සතර විභක්තිහු අතීත කාලයෙහි
වෙති )

27. කාලො, කාලයනොම; අතීත, අතීතක්‍රියාය; වත්තමා
නා, වර්තමානක්‍රියාය; අනාගතක්‍රියලක්ඛණෙ, අනාගතක්‍රියා
ය යන මොවුන් ලක්ෂණ කොට ඇත්තේය; ක්‍රියෙ, ක්‍රියා
වනමා; ආරද්ධා, පටන්ගන්නා ලදින්; අනිට්ඨිතෙ, නොනි
මි කල්හි; පච්චුප්පන්නො කාලො, වර්තමාන කාලයයි; ම
තො, දන්නා ලදී—

(අතීත වර්තමාන අනාගත යන ක්‍රියා ලකුණු කොට ඇ
තියේ කාලනම්—ක්‍රියාව පටන්ගෙණ නොනිමි කල වර්ත
මාන කාලනම්—"පචති ,, පිසෙයි යිකල පචන ක්‍රියාව ප
ටන්ගන්නා ලදයි හැගෙන්මුත් නිමියේයි හැගෙන්නේ
නොවේ—" වත්තතීති වත්තමානං ,, (වතු වත්තනෙ) ව
ත්තති ඉති, පවතීනුයි; වත්තමානං, වර්තමාන නම්; ( ඒ ව

28 ක්‍රියා සන්තාන විච්ඡෙදෙ, කාලොතීතොති ගම්‍යතෙ
අනාගතො අනාරම්භෙ, ක්‍රියායතු පතීයතෙ.

29 අලද්ධවුත්ති භූතානං කත්තාදි, කාරකගනාම සාධියං
පදත්‍ථං කත්තුකම්මට්ඨං, ක්‍රියමිච්ඡන්ති තබ්බිදූ.

---

නුවයි) ඒ වර්තමානාර්ථ ප්‍රතිපාදකවූ විභක්තිද වාච්‍ය වාච ක දෙදෙනාගේ අභෙදෝප චාරයෙන් වර්තමානනම්වේ— " වත්ත මානාමිති ,, යන්නතු කෙරෙන් මානප්‍රත්‍යයද න කාරයහට විඤ්ද කොට වත්තමාන ශබ්දයා කෙරෙන් ස්ත්‍රී ලිඟුවෙහි ආප්‍රත්‍යය කළකල්හි " වත්තමානා ,, යනුවේ)

28. ක්‍රියා සන්තාන, ( පටන්ගත් ) ක්‍රියා පරම්පරාවගේ; විච්ඡෙදෙ, නිමාවක්වූ කල්හි; කාලො, කාලයතෙමේ; අ තීතොඉති, ඉකුත්යයි; ගම්‍යතෙ, හැඟෙයි, ක්‍රියායතු; ක්‍රි යාවගේ වනාහී, අනාරම්භෙ, පටන් නොගැන් මෙහි ලා; අනාගතො, අනාගත කාලයයි; පතීයතෙ, හැඟෙයි.

(පටන්ගත් ක්‍රියාව නිමි කල අතීතනම—යම් ක්‍රියාව ක් පටන් නොගත් කල අනාගත නම—" පච්චුප්පන්න භාවං අතික්කම්ත්වා ඉතොගතො පවත්තොති අතීතො,, ( අතිපුබ්බො-ඉගතිම්හි )පච්චුප්පන්න. භාවං, වර්තමානකා ලභාව, අතික්කම්ත්වා, ඉක්ම,ඉතොසීසේයි, ගතො සීයේයි; පවත්තො ඉති, පැවැත්තේ නුයි; අතීතො, අතීත නම— "නආගතො අනාගතො,, නආගතො, (සම්පයට ) නොපැ මිණියේ, අනාගතො, අනාගත නම් )

29 අලද්ධභූතානං, ද්‍රව්‍යනුවූ, කත්තාදි කාරකගනාම සාධි යං, කත්තාදි, කර්තෘ කරණාදිවූ, කාරකගනාම, කාරක ස මූහයා විසින්, සාධියං, සිඛකටයුතුවූ, කත්තුකම්මට්ඨං, ක ර්තෘ කර්ම දෙදෙනා කෙරෙහි පිහිටියාවූ, පදත්ථං, පදාර්ථය, ක්‍රියං, ක්‍රියාවයි, තබ්බිදූ, ඒ ක්‍රියාදත්නාහු, ඉච්ඡන්ති, කැ මැති වෙ.

30 අක්ඛාතපච්චයා සබ්බෙ, භවෙය්‍යුං සාධනත්තයෙ
කත්තා කම්මඤ්ච භාවො ච, සාධනානීති වුච්චරෙ.

("දෙවදත්තො ගච්ඡති,, යනාදීන්හි පාඨයන් පනනාම පනනාදි සමරූපවූ ගමනය දෙවදත්තාඛ්‍යවූ කර්තෘ කෙරෙහි පිහිටිහෙයින් කර්තෘසාධ නම—" ඔදනං පචති,, යන්නෙහි පිණ්ඩලදය ලක්‍ෂණවූ පචනය ඔදනාඛ්‍යවූ කර්මයෙහි පිහිටි හෙයින් කර්මාර්ථවූ පදාර්ථනම—" දෙවදත්තො භවති,, යන්නෙහි කර්තෘවූ එකම දෙවදත්තයා මුත් කාරක සමූහයක් නැත—භවනක්‍රියාව කෙසේ සාධ්‍ය වේදයත්?—දෙවදත්තයී නිකළ අසවල් තැන්හිය අසවල් කල්හිය යන්නක් අපෙක්‍ෂා කරණු හෙයින් ආධාර කාරකය ලැබෙන හෙයින් කාරකයී සමූහය ඇත්මැයී—මෙසේම සෙසුතැන්හිදු දතයුතුයි—"සද්දානු රූපං අසති භවතීති අත්‍ථො,, (අසතුම්) සද්දානු රූපං, ශබ්දානු රූපව, අසති සීයේයි, භවති ඉති, වේනුයී, අත්‍ථො, අර්ථනම්—" සද්දානු සාරෙන අධිගන්තබ්බයනෙහිමා අත්‍ථො, ( අරගමනෙ ) සද්දානු සාරෙන; ශබ්දානු සාරයෙන්, අරියනෙ සීසේයි, ඛ්‍යයනෙහූහි, දත්නාලැබේනුයී, අත්‍ථො, අර්ථනම—" පදස්ස අත්‍ථො පදත්‍ථො,, වාච්‍ය වාචකසම්බන්ධයෙන් පදය පිළිබඳවූ අර්ථය පදාර්ථනම්—පදයෙන් වාච්‍යවූ අර්ථය පදාර්ථය සීසේයී—පදාර්ථය ද නාම ජාත්‍යාදි මැයී—නාමාදිවූ පදාර්ථයන් කෙරෙත් යමෙක් මෙකී ලක්‍ෂණයෙන් යුක්තවූ නම ඒ ක්‍රියානම් )

30 සබ්බෙ, සියලු; අක්ඛාතපච්චයා, ආඛ්‍යාත ප්‍රත්‍යයෝ; සාධනත්තයෙ, සාධනත්‍රයෙහි, භවෙය්‍යුං, වන්නාහුය, (ඒ සාධන ත්‍රණනම් කිමයත්) කත්තා, කර්තෘද; කම්මඤ්ච, කර්මයද; භාවො ච, භාවයද; සාධනානි, කාරකහයි; ඉධ, මේ මාගධ ව්‍යාකරණයෙහි; වුච්චරෙ, කියනු ලැබෙත්.

(මාගධ ව්‍යාකරණයෙහි සාධන ව්‍යවහාරය කැරෙන සා

31 සකම්මකම්මා ධාතුම්හා, කත්තුකම්මෙසු හොන්ති තෙ*
න භාවෙ කම්මරහිතම්හා, කත්තුභාවෙසු නාපරෙ †

32 කම්මාවචනිච්ඡායං, න විරුජ්ඣන්ති සකම්මකා
භාවෙපි නං යථා ගෙහෙ, දෙවදත්තෙන පච්චතෙ.

---

ධ්‍යය—මෙති අභාවියටද ඇති—එහෙයින් ඉඩ යනු කියා—ඒ ආඛ්‍යාත ප්‍රත්‍යයෝ සාධනතුණෙහි වෙතිසී—පළමුකො ච සාමාන්‍යයෙන් දක්වා දැන් විශෙෂ කියනු ලැබේ)—

31 තෙ, ඒ ආඛ්‍යාත ප්‍රත්‍යයෝ; සකම්ම කම්මා, කර්මසහිතවූ; ධාතුම්හා, ධාතුහු කෙරෙන්; කත්තු කම්මෙසු; කර්තෘ කර්ම දෙක්හි; හොන්ති, වෙත්; කම්මරහිතම්හා, අකර්මක ධාතුහු කෙරෙන්; කත්තුභාවෙසු, කර්තෘ භාව දෙක්හි වෙත්; අපරෙ, (අනික්) කර්මකාරකයෙහි; න, නොවෙත්;

(සකර්මක ධාතුහු කර්තෘ කාරකයෙහිද කර්ම කාරකයෙහිද සිඩවෙති—භාව කාරකයෙහි නොවෙති—අකර්මක ධාතූහු කර්තෘ කාරකයෙහිද භාව කාරකයෙහිද සිඩවෙති—කර්ම කාරකයෙහි නොවෙති—"කම්මෙන සහ වත්තතීති සකම්මකො" කම්මෙන සහ, කර්මය හා සමග; වත්තති ඉති, පවතීනුයි; සකම්මකො, සකර්මක නම්—"කම්මං නත්ථි යස්සසො අකම්මකො" කම්මං, කර්මය; යස්ස, යමෙක්හට; නත්ථි, නැත්තේද; සො, තෙනෙම; අකම්මකො, අකර්මක නම්—සකර්මක ධාතුහු කෙරෙන් භාවයෙහිද සමහර තැනෙකවුව විරොධ නැතිබව දක්වනුලැබේ)

32 කම්මාවචනිච්ඡායං, ඇති කර්මයක් නොකියවි කල්හි; සකම්මකා, සකර්මක ධාතුහු කෙරෙන්; භාවෙ අපි, භාවයෙහිද; නවිරුජ්ඣන්ති, ප්‍රත්‍යයන්ගේ වීම විරුඩනොවේ; නං යථා, හේ මෙසේයි; දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; ගෙහෙ, ගෙති; පච්චතෙ, පිසීමයි.—

---

* සකර්මකානං ධාතූනාං, තනාදිඃ කර්තිර් කර්මණි
† අකර්මකානං ධාතූනාං, භාවෙ කර්තිර යාන්තෙ.

33 සන්තම්පි වත්‍ථු මිච්ඡා න, ඛ්‍යාපය සතම්පි සා නවෙ
තං යථා අනුදරා කඤ්ඤා, සමුද්දො, කුණ්ඩිකා තිව—
34 උපසග්ග වසා කොචි, අකම්මොපි සකම්මකො
යථාභි භූයතෙ රාගො නාපසෙන මහිද්ධිනා *—

(පමුයනු සවභාවයෙන් සකර්මක හෙයින් ඇතිනාදවූ කර්‍මය වක්නෘනු නොකියව්වූ හෙයින් භාවයෙහිදු ප්‍රත්‍යයවී මෙසේව සෙසු තන්හිදු දතයුතුයී—ලොකයෙහිදු ඇති දෙයක් සමහර නෑසෙක්ති නොකියව් බවද නැතිදෙයක් කියව් බවද දක්වනු ලැබේ)—

33 සන්තං අපි, ඇතිද වස්තුවක්; වත්‍ථුං, කියන්ට; ඛ්‍යාපි, සමහර නෑනෙක්ති; ඉච්ඡා න, ඉච්ඡා නැති; අසන්තං අපි, නැතිද වස්තුව; වත්‍ථුං, කියන්ට; සා, ඒ ඉච්ඡානොමෝ; භවෙ, වන්නීයී; නං යථා, හේ මෙසේයී; කඤ්ඤා, කන්‍යා නොමෝ; අනුදරා, බඩ නැත්තිය; සමුද්දො, සමුද්‍රය නොම; කුණ්ඩිකා ඉතිව, කුණ්ඩිකා යෙතැයිද කියත්—

(මෙහි බඩනැතිව කන්‍යාවක් නම් නැතිහෙයින් බඩඇත්මය එනකුදු වුවත් කුඩාබඩ කියව්ව අනුදරායී කියත්—කුණ්ඩිකා ස්වරූපයෙන් නැත්නාදවූ සමුද්‍රය කුණ්ඩිකාවක් ද කොට කියත්)—

34 කොචි, කිසි; අකම්මොපි, අකර්මක ධාතුද; උපසග්ගවසා, උපසර්ග බලයෙන්; සකම්මකො, සකර්මකවේ; යථා, මෙසේයී; මහිද්ධිනා; මහත්වූ සෘද්ධිඇති; නාපසෙන, තාපස්වීනු විසින්; රාගො, රාගයනෙමේ; අභිභූයතෙ, මඩනා ලැබේ

(මෙහි "භූ,, යන ධාතුහු ස්වභාවයෙන්ම අකර්මක වුවද " අභි ,, යන උපසර්ගයාගේ යොග හෙයින් සකර්මක වෙයි එයින් කර්මයෙහි යප්‍රත්‍යයවේ—සකර්මකයන්ට අකර්මකයන්ටද ලක්ෂණ කියනු ලැබේ)--

* උපසග්ගෙන ධාත්වත්‍ථො, බලා දඤ්ඤ නීයතෙ
විහාර හාර සංහාර, ප්‍රතිහාර ප්‍රභාරවත්—

35 කත්තුවාචිනි ධාතුම්හි, යස්මිං කම්මං ගවෙස්සතෙ
සකම්මකොති සො ඤෙය්‍යො, තබ්බිරුද්ධොඅකම්මකො
36 දුහ යාච රුධි පුච්ඡ, භික්ඛ සාස වචාදයො
නී වහ හර දයො ච, උභයෙ නෙ මිකම්මිකා*—

---

35 යස්මිං ධාතුම්හි, යම් ධාතුවක්; කත්තුවාචිනි, කර්තෘවාච්‍ය කල්හි; කම්මං, කර්මයනෙම; ගවෙස්සතෙ, සොයනු ලැබේද; සො, ඒ ධාතුනෙම; සකම්මකො ඉති, සකර්මක යයි; ඤෙය්‍යො, දතයුත්තෝය; තබ්බිරුද්ධො, එයට විරුද්ධ වූයේ; අකම්මකො; අකර්මක නම්—

(යම් ධාතුවක් විසින් කර්තෘහු කියන ලබන කල්හි කර්මයෙක් අපෙක්ෂා කරණු ලැබේනම් ඒ ධාතුව සකර්මක නම—යම් ධාතුවක් විසින් කර්තෘහු කියනු ලබන කල්හි කර්මයෙක් අපෙක්ෂා කරණු නොලැබේ නම් ඒ අකර්මක නමැයි යේයි—ප්‍රත්‍යයන් නැතිව කෙවල ධාතුහු අභිවාචී නොව තුදු කර්තෘවාචී යයි කියේ අවයවයෙහි සමුදායොපචාරයෙනි—යම්සේ සමුද්‍රයෙන් එක් දෙශයක් දුටද සියළු සමුද්‍රය දුටුවායේ සමුද්‍රය දක්නා ලදැයි කියනු ලැබේද මෙහිදු එපරිද්දෙනැයි යේයි)

36 දුහ, දුහයන ධාතුය; යාච, යාචයන ධාතුය; රුධි, රුධියන ධාතුය; පුච්ඡ, පුච්ඡයන ධාතුය; භික්ඛ, භික්ඛය

---

* දුහ් යාච් පච් දණ්ඩ රුධිප්‍රච්ඡි, චි බ්‍රූ ශාසු ජිමථමු ෂාම්
කර්මයුක් ස්‍යාද කථිතං, තථා ස්‍යාන් නී හෘ කෘෂවහාම් (සාර
දුහි යාචාඥ බ්‍රැවශාසිඡව, පචතිශචි ජි දණ්ඩයඃ සවත)
රුධිර් ප්‍රච්ඡි මීථහිශච, මුෂිඃ ශාසිඃ දුහාදයඃ—
නාද්‍යො නයතිඃ ප්‍රොක්තඃ, කෂිතිඃ හරති වීනිඃ
දුහාදි චාදශ නාදි, චත්වාරශ්ච මිකර්මිකාඃ—

න ධාතුය; සාස, සාසයන ධාතුය; වච, වචයනු ධාතුය යන; ආදයො, මේ ආදිහුද; නී, නීයන ධාතුය; වහ, වහය න ධාතුය; හර, හරයන ධාතුය යන; ආදයො, මේ ආදිහු ද(හුන;) නෙ උභයෙ; ඒ දෙපක්‍ෂයෙහි ධාතුහු; විකම්මි කා, කර්‍මදෙකක් ඇත්තාහුය—

(“ගොපාලො ගාවිං දොහතීති වුච්චන්ත ගාවිතාහි එකං කම්මං පුන කිං දොහතීති ගවෙසනායං ඛීරනාහි අපෙක්ඛිත මානත්තා ඛීරත්තිම එක කම්මං කම්මවයං දුහාදිප්පයොගෙ සම්භවති,, “දුහපප පූරණෙ, පිරීමෙහි—“යාච යාචනෙ,, ඉල්වීමෙහි—“රුධි ආවරණෙ,, මුවාකිරීමෙහි—“ පුච්ඡ පුච්ඡනෙ,, ප්‍රශ්නයෙහි—“භික්ඛ යාචනෙ, ඉල්වීමෙහි—“සාස අනුසිට්ඨිම්හි,, අනුශාසනා කිරීමෙහි-“වච බ්‍යත්තවචනෙ,, කීමෙහි—මේ දුහාදි ධාතුහුයි—‘නී පාපුණනෙ, පැමිණීමෙහි—‘වහ පාපුණනෙ, ඉසිලීමෙහි-හර හරණෙ, හැරීමෙහි—මේ නයාදි ධාතුහුයි— “ගොපාලෙන ගොඛීරංදුය්හතෙ, දුඩාවා-බ්‍රාහ්මණෙන ගහපති ඔදනං යාචියතෙ, යාචිතොවා—ගොපාලෙන ගො වජං රුජ්ඣතෙ, රුද්ධොවා—සිස්සෙන ගරු ධම්මං පුච්ඡීයතෙ, පුට්ඨොවා—විපෙපන ජනො භත්තං භික්ඛියතෙ, භික්ඛිතොවා—ගරුනා සිස්සො ධම්මං අනුසාසීයතෙ අනුසාසිතොවා—පණ්ඩිතෙන ජනො කථානිඛ මුච්චතෙ, වුත්තොවා,,—මේ දුහාදීන්ට උදාහරණයි—“දාසෙන භාරො ගාමං නීයතෙ, නීතොවා—දාසෙන භාරො ගාමං වුය්හතෙ, වහිතොවා—දාසෙන භාරො ගාමං හරීයතෙ, හටොවා—මේ නී ආදීන්ට නිදර්‍ශනයි—මෙහි “දුය්හතෙ,, යනු ආඛ්‍යාත විෂයෙහිය—“දුඩා,, යනු කිතක විෂයෙහිය)

37 උපෙච්චත්ථං සජ්ජන්තීති, උප සග්ගා හි පාදයො*
චාදී පදාදි මජ්ඣන්තෙ, නිපාතා නිපතන්ති හි†

38 සදිසා යෙ තිලිඞ්ගෙසු, සබ්බාසු ච විභත්තිසු
වචනෙසු ච සබ්බෙසු, තෙ නිපාතාති කිත්තිතා‡

---

37 පාදයොති, පාදිහු වනාහී, උපෙච්ච (ධාතූන්ගේ)සමීපයට පැමිණ, අත්ථං,අර්ථය, සජ්ජන්ති ඉති, ප්‍රකාශකෙරෙත් නුයී, උපසග්ගා, උපසර්ග නම්වෙත්, චාදීනි, චාදිහු වනාහි; පදාදි මජ්ඣන්තෙ, පදයන්ගේ ආදිමධ්‍යාවසානයෙහි, නිපතන්ති (ඉති) වැටෙත් (නුයී,) නිපාතා, නිපාත නම් වෙත්—

("ප, පරා, නි, නී,, යනාදිහු ධාතූන්ගේ සමීපයට පැමිණ අර්ථ ප්‍රකාශ කෙරෙත් යන අර්ථයෙන් උපසර්ග නම් වෙති—" ච, න, ච, වා,, යනාදිහු පදයන්ගේ මුල මැද කෙළවර වැටෙත් යන අර්ථයෙන් නිපාත නම්වෙති—උපසර්ගයෝ ධාතූන්ගේ පූර්වභාගයෙහිසිට අර්ථප්‍රකාශකෙරෙති—ඒ මෙසේයී- "අභිසම්බුජ්ඣති- අභිභවති,, යනාදිය යී—නිපාතයෝ පදයන්ගේ මුල මැද කෙළවර සිටිති—ඒ මෙසේයී—"අථ ඛො භගවා, සාච,සොච,භාසතිවා කරොතිවා,, යනාදි යයී)

38 යෙ, යම් පද කෙණෙක්; තිලිඞ්ගෙසු, තුන් ලිඟුයෙහිද; සබ්බාසු ච විභත්තිසු, සියළු විභක්ති යෙහිද; සබ්බෙසු

---

* යස්මා දුප සඤ්ජනයන්ත්‍යර්ථාන්, පදසෙත පරි ගච්ඡති
ක්‍රියායොග වශස්තස්මා, දුපසර්ග ඉතිස්මෘතාඃ—

† යස්මා ද්‍යන්ත මධ්‍යෙෂු-චාප්‍රයොග විශෙෂණාඃ
නිපතන්ති විචිත්‍රාර්ථා, නිපාතා තෙන සංඥිතාඃ—

‡ සදෘශං ත්‍රිෂු ලිඞ්ගෙෂු, සර්වාසු ච විභක්තිෂු
වචනෙෂු ච සර්වෙෂු, යන්නව්‍යෙති තදව්‍යයං—

39 සන්ත මෙවති නීලාදි, වණ්ණං දීපාදයො විය
ධාතුස්මිං සන්තමෙ වත්ථං, උපසග්ගා පකාසකා.

40 ධාත්වත්ථං බාධතෙ කොචි, කොචි තං අනු වත්තතෙ,
තමෙවඤ්ඤො විසෙසෙති, උපසග්ග ගතී තිධා *

---

වචනෙසු ච, සබ්බෙ ච වයයෙහිදු; ,සදිසා, සමයෝද; ( එ කාකාරයෝද, අන් ප්‍රකාරයකට නොපැමිණෙද්ද ) නෙ ඕහු; නිපාතාඉති,නිපාතයෝයයි;කිත්තිතා,කියනලද්දුහුයී

(මෙති "උච්චං රුක්ඛා-උච්චංලතා, උච්චං ඝරං,, යනා දිය තුන් ලිඞ්ගයෙහි සමාන්වට උදාහරණයි— "උච්චං රු ක්ඛා-යො උච්චං රුක්ඛ,, යනාදියවිභක්තීන්ට උදාහරණ යි—"උච්චං රුක්ඛො තිඨ්ඨති-උච්චං රුක්ඛා තිඨ්ඨන්ති,, ය නාදිය වචනයන්ට උදාහරණයි—සෙසු තත්හිදු මෙසේ යෙදිය යුතුයි)

39 සන්තං එවති, පෙරඇතිමවූ; නීලාදි, නීලාදිවූ; ව ණ්ණං, පැහැය; දීපාදයො විය, දීපසූයනාදීන් මෙන්; ධාතු ස්මිං, ධාතුවෙහි; සන්තං එව අත්ථං, ඇතිම අර්ථය; උපස ග්ගා, උපසර්ගයෝ; පකාසකා, ප්‍රකාශ කෙරෙත්.

(යම්සේ දීපාදිහු ඇති පැහැයක් ප්‍රකාශ කරනමුත් නැ ති වර්ණයක් ප්‍රකාශ නොකෙරෙද්ද එපරිද්දෙන්ම උප සර්ගයෝ ධාතුයෙහි ඇතිව සැඟවී සිටි අර්ථය ප්‍රකාශ කර නමුත් නැති අර්ථයක් ප්‍රකාශ නොකොට හෙති—එහෙයි න් අනෙකාර්ථ වාචක වන්නෝ ධාතුහුමය, උපසර්ගයෝ එම අර්ථ ජනකනයි සේයි)

40 කොචි, සමහර උපසර්ගයෙක්; ධාත්වත්ථං, ධාතුනු ගේ අර්ථය; බාධතෙ, බාධාකෙරේ; කොචි, සමහර උපස ර්ගයෙක්;තං, ඒධාත්වර්ථයට; අනුවත්තතෙ, අනුව පවතී; අ ඤ්ඤො, අනික් උපසර්ගයෙක්; තං එව, ඒධාත්වර්ථයම;විසෙ

---

* ධාත්වර්ථං බාධතෙ කශ්චිත්, කශ්චිත්තමනුවර්තතෙ
තමෙව ශෙෂ විශිනෂ්ටි, උපසර්ග ගතිස් ත්‍රිධා.

41 උපසග්ගාච නිපාතාච, පච්චයා ධාතවො චිමෙ *
නෙකෙ නෙකත්ථ විසයා, ඉති නෙරුත්තිකා බ්‍රවුං †
පදභෙදෙ, සමනෙතා.

---

සෙහි, වෙසෙසයි, උපසග්ගහති, උපසර්ගයාගේ පැවැත්ම; තිබා, තුන් පරිද්දකින් වේ.

"(අභි භවති,, මඩී-මෙහි "අභි,, යන [illegible] නෙම තමාගේ අර්ථය ප්‍රකාශ කෙරේ "භූ,, යන ධාතුහුගේ අර්ථය බාධා කෙරෙයි—"අධිගතො,, පැමිණෙන ලද්දේය මෙහි "අධි,, යන උපසර්ගය නෙම ගමු ධාතුහුගේ අර්ථය ට අනුව පවති—"සුභාසිතො,, යහපත් කොට කියන ලද්දේය—මෙහි "සු,, යන උපසර්ගය නෙම "භාස,, යන ධාතුහුගේ අර්ථය වෙසෙසයි සේයි)

41 උපසග්ගාච, උපසර්ගයෝද; නිපාතාච, නිපාතයෝද පච්චයාච, ප්‍රත්‍යයෝද; නෙකෙ ධාතවොච, නොයෙක් ධාතූහුද යන; ඉමෙ, මොහු; අනෙකත්ථ විසයා ඉති, නොයෙක් අර්ථ විෂයකොට ඇත්තාහු යයි; නෙරුත්තිකා, නෛරුක්තිකයෝ; අබ්‍රවුං, කීහු.

( " ප, පරා, නි, නී ,, යන ආදි උපසර්ගයෝද—" ච, න, ව, වා ,, යන ආදි නිපාතයෝද—"ණ-ණික,, යන ආදි ප්‍රත්‍යයෝද—" භූ-පච ,, යන ආදි ධාතූහුද අනෙකාර්ථයෝ යයි වෛයාකරණයෝ කියති—උපසර්ගයෝ "උපසග්ගාඩ්කුස-උපසග්ගානු ලොම වශයෙන් ම්ප්‍රකාරවෙති—යම් උපසර්ගයෙක් ධාතූන් හා සමග යෙදුනු කල ධාතුහුගේ අර්ථයවලකාද ඒ උපසග්ගාඩ්කුස නම—"ජිනො ලොකං අභිභවති,, යනු ඊටනිදර්ශ නයි—යම් උපසර්ග යෙක්ධාතූන්හා සමග යෙදුනුකල ධාතුහුගේ අර්ථය නොවලකා

---

*"පච්චයාච ඉමෙ නයො, තිපි පාඨො අසුද්ධුනත් දිස්සතෙ,'
† නිපාතාශ්චො පසර්ගාශ්ච, ධාතවශ්චෙති තෙ ත්‍රයම්
අනෙකාර්ථාඃ සමෘතාඃ සර්වේ, පාඨස්තෙෂාං නිදර්ශනම්

ද—ඒ උපසර්ගානුලොම නම—"උග්ගච්ඡති සූරියො,, යනු එට නිදර්ශනයි—එයින් කීහ—

"උපසග්ගද්ධ සඞ්ඛ්‍යාච, උපසග්ගානුලොමතා
උපසග්ගා දුවිධාති, විඤ්ඤෙය්‍යා සාර මතිනා—
යදා උපසග්ග යුත්තා, ධාතවො ද්‍යොතකො අත්ථං
ජොතන්ති තිඋපසග්ග, ද්ධුසො නාමාති වුච්චති—
යදා පස ජ්ජනාති, තදා තු කුලනාති වුච්චති
අනුකූලයනෙ යා සුබං, උග්ගච්ඡති සූරියො කමා,—


නිපාතයෝ එකාක්ෂර නිපාත ද්‍ව්‍යක්ෂර නිපාත ත්‍ර්‍යක්ෂර නිපාත චතුරක්ෂර නිපාත පඤ්චාක්ෂර නිපාත වශයෙන් පස්වැදෑරුම් වෙති-ඒබැලාව තාරාදියෙන්දත්ත—"තං තං කාරණං වා සද්ද නිප්ඵත්තිං වා පටිච්ච එන්තීති පච්චයා,, (පති පුබ්බො-ඉගතිම්හි-අයගතිම්හි වා) තං තං කාරණංවා පටිච්ච,ඒ ඒ කාරුණ්‍ය නිසා හෝ; සද්ද නිප්ඵත්තිං වා ඒ ඒ ශබ්දයන්ගේ නිෂ්පත්තිය නිසා හෝ; එනති ඉති එත් තුයි; පච්චයා, ප්‍රත්‍යයෝ නම් වෙත්—එයින් කීහ—

පටිච්ච කාරණං තං තං, එන්තීති පච්චයා එවං
පටිච්ච සද්ද නිප්ඵත්තිං, ඉතො එන්තීති පච්චයා—

(ප්‍රත්‍යයෝ ස්ත්‍රීලිඞ්ග ජෝතකප්‍රත්‍යය, විභක්ති ප්‍රත්‍යය, තද්ධිතප්‍රත්‍යය, ආඛ්‍යාතප්‍රත්‍යය, ධාතුප්‍රත්‍යය, කිතකප්‍රත්‍යය, විකරණප්‍රත්‍යය, රූප සංසිද්ධිප්‍රත්‍යය, කාරිතප්‍රත්‍යයයි කියා නව වැදෑරුම්වෙති- "ආ-ඊ-ඉනී,,- යනාදී ප්‍රත්‍යයෝ ස්ත්‍රීලිඞ්ගජෝතකප්‍රත්‍යයෝ නම්වෙත්-'සො-අං-එ,යනාදිප්‍රත්‍යයෝ විභක්තිප්‍රත්‍යයන-ණ-ණායන-ණාන,යනාදිප්‍රත්‍යයෝ තද්ධිතප්‍රත්‍යයන"ති,අන්ති,,යනාදිවිභක්තිහුආඛ්‍යාතප්‍රත්‍යයන-"ඛ,ඡ,ස,,යනාදිප්‍රත්‍යයෝධාතුප්‍රත්‍යයන- "ණ,අ,ණ්වු,, යනාදිප්‍රත්‍යයෝ කිතකප්‍රත්‍යයන-"අ-ඉ-ඊ-එ-ය-ඔ,, යනාදිප්‍රත්‍යයෝ විකරණප්‍රත්‍යයන-යප්‍රත්‍යයාදිහුරූපසංසිද්ධිප්‍රත්‍යයන'ණෙ-ණය, යනාදිප්‍රත්‍යයෝ කාරිතප්‍රත්‍යයෝ නම්හුයි)

පදභෙදය සමාප්තයි

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු